# Abstract No 90

## පරමාණුවාදය පිළිබඳ බෞද්ධ ඥානමීමාංසාත්මක අධ්‍යයනයක් (සෞත්‍රාන්තික හා වෛභාෂික මත ගැටුම ඇසුරින්)

**පූජ්‍ය කඩවලවැවේ කල්‍යාණ හිමි**
දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
kadawalawewe1989@gmail.com

විශ්වීය මූල ධාතූන් පිළිබඳ පාරමාර්ථික ගවේශනයේ ප්‍රතිඵලයක් ලෙස දාර්ශනික පරමාණුවාදය පිළිබඳ සංකල්පනාවන් ප්‍රභවය විය. ග්‍රීක දාර්ශනික ඩිමොක්‍රීටස් එහි ආදි කර්තෘ බව බොහෝ දෙනාගේ පිළිගැනීම යි. භාරතීය න්‍යාය වෛශේෂික සම්ප්‍රදායන්හි ද සංස්කෘත බෞද්ධ දර්ශනය තුළ ද පරමාණුවාදය පිළිබඳ ප්‍රබල මතවාදයන් ඉදිරිපත් කෙරේ. මුල් බුදුසමය කේන්ද්‍ර කරගත් ථේරවාදය තුළ මේ පිළිබඳ අදහස් ගැබ් වී ඇතත් මෙය වාදයක් ලෙස සංවර්ධනය කරන්නේ සෞත්‍රාන්තික හා වෛභාෂික යන මහායානික බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායද්වයයි. වෛභාෂිකයන් පරමාණුව අවයව රහිත (නිරවයව) හා ප්‍රතිඝාත රහිත බව දක්වා තිබේ. තව ද පරමාණුව පැති හයක් සහිත නොබෙදිය හැකි පදාර්ථයක් බව ඔවුන්ගේ මතය යි. පරමාණු ඥානයට ගෝචර වන්නේ තනි තනි ව නොව සමූහයක් එක් වූ විට බවත් එසේ නිෂ්පන්න ප්‍රපංච ලෝකය අස්ථිර වුවත් මූල ධාතූන් අස්ථිර නොවන බව සර්වාස්ථික සිද්ධාන්තය මත පදනම් වූ වෛභාෂිකයන්ගේ අදහසයි. සෞත්‍රාන්තික මතය මීට තරමක් ප්‍රතිපක්ෂය. ඔවුහු පරමාණුවේ දිග්භාගභෙදත්වයක් ඇතැයි පිළිගන්නා අතර පරමාණුව නිරවයව නම් එය රූප වශයෙන් පිළිගත නොහැකි බව පෙන්වා දෙති. එසේ ම මෙම දර්ශනද්වය ඇතැම් මතයන් තුළින් පරමාණු පිළිබඳ සාදෘශ්‍ය මතයන් ද දරා ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව වන්නේ පරමාණුවාදය කෙරෙහි වෛභාෂික හා සෞත්‍රාන්තික බෞද්ධ දාර්ශනික මත ගැටුම් පිළිබඳ ව ඥානමීමාංසාත්මක ව අධ්‍යයනය කිරීම යි. මෙහි අධ්‍යයන අරමුණ වන්නේ පරමාණුවාදය පිළිබඳව වෛභාෂික හා සෞත්‍රාන්තිකදාර්ශනික සම්ප්‍රදායන් කෙබඳු මතවාදයන් දරා ඇත් ද යන්න හා මෙම ප්‍රස්තුතය විෂයෙහි උක්ත සම්ප්‍රදායන් දරණ පරස්පරතාවන් පිළිබඳව විමර්ශනය කිරීම යි. එහි දී වෛභාෂික හා සෞත්‍රාන්තිකයන් ඉදිරිපත් කර ඇති මත සියුම් ව සංසන්දනාත්මකව විමර්ශනය කරමින් ඒවායෙහි විද්‍යමාන වන සමවිෂමතා ප්‍රාථමික හා ද්විතීක සාහිත්‍ය මූලාශ්‍ර ආශ්‍රයෙන් අධ්‍යයනය කරනු ලැබේ. උක්ත කරුණු තුළින් සාධනය කළ හැක්කේ වෛභාෂික හා සෞත්‍රාන්තික යන මෙම මහායාන බෞද්ධ සම්ප්‍රදායෝ පරමාණු පිළිබඳ විවිධ මතවාදයන් ඉදිරිපත් කරමින් බාහිර ලෝකයේ සත්තාව පිළිබඳ ගවේෂණයන් සිදු කර ඇතත් එයින් ප්‍රාමාණික බෞද්ධ ඥානමීමාංසාත්මක දැනුමක් නොලැබෙන බව යි. එහෙත් එම මතවාදයන් දීර්ඝ කාලයක් තුළ විවාදයට භාජනය වෙමින් විවිධ මත ගැටුම්වලට පාදක වී ඇත යන්නයි.

**මුඛ්‍ය පද -** පරමාණුවාදය, වෛභාෂික, සෞත්‍රාන්තික, සත්තාව ඥානමීමංසාව